# නෙලී.



නේතිනී අමල්යා බණ්ඩාර.

# නෙලී

නේත්නී අමල්යා බණ්ඩාර.

කතෘ අයිතිය ISBN 978-624-208-560-9

පාසල- මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර.

පංතිය 1-C

කෘතිය පළ කරන දිනය 2025.02.08

**පිදුම**

කිසිත් නොදැන මහාමායා මෑණියන් වෙත පිය නැගූ දින පටන් අද වන තුරු ඉතා ආදරයෙන් ගුරු හරුකම් ලබා දුන් ආදරණීය ප්‍රමිතා වෙත්තසිංහ ගුරු මෑණියන්ට ඉතා ආදරයෙන් මෙය පුදමි.

# පෙරවදන


සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණියුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.මෙම ශාස්ති්‍රය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.


විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.


නෙලී මගේ සුරතල් බව්වා ගේ නමයි.හැබැයි නෙලී අපේ ගෙදර තියා ගන්න අම්මා කැමතී නෑ.





නෙලී අපේ ගෙදර ඉස්සරහ ගෙදර ඉන්නේ. අපේ ගෙදර බච් රාළ නැති වුණාට පස්සේ නෙලී අපේ ගෙදර නිතර නිතර එන්න ගත්තා.

නෙලී හරිම කැමතී කිරි බොන්න.ආයේ කැමතී පාං බිස්කට් මස් කටු වගේ දේවල් කන්න.මං අපේ අම්මාට හොරෙන් අපිට දෙන බිස්කට් නෙලීට දෙනවා.නෙලීත් ඒවා රස කර කර කනවා.



නෙලීට ලස්සන ඇස් දෙකකුයි තෙත හොම්බකුයි තියෙනවා.නෙලී සුදු පාටයි.හැබැයි නෙලී නාන්න කම්මැලී.



එක දවසක් අම්මායි මමයි එකතු වෙලා නෙළීව නැව්වා.නෙළී නාලා ඉවර වුණ ගමන් කරේ වැලි ගොඩක් උඩට ගිහිල්ලා වැලි නාලා ආපු එකයි.



අක්කියි මමයි උදේට ඉස්කෝලේ යන්න වාහනයට නගින කොට නෙලී ගේට්ටුව ළඟට ඇවිල්ලා බලාගෙන ඉන්නවා.අපි ගෙදර එන වෙලාවටත් නෙලී කොහේ හිටියත් එයාගේ නගුට වන වනා දුවගෙන එනවා.




නෙලී ගොඩක් වෙලාවට ඉන්න කැමතී වැලි ගොඩට වෙලා ඉන්න.එහෙම ඉන්න කොට එයාගේ ඇෙඟ් සත්තු හැදෙනවා කියලා අම්මා කිව්වා.



එක දවසක් අක්කී කණ රිදෙනවා කියලා කෑ ගහන්න ගත්තා.බලන කොට අක්කීගේ කණ ඇතුලට නෙලීගේ සතෙක් ගිහිල්ලා කියලා අපි දැන ගත්තා.එදා ඉඳලා අම්මා නෙලීව අපේ ගේට්ටුවෙන් ඇතුළට ගත්තේ නෑ.



අපි සෙල්ලම් කරන හැමදාම නෙලී ගේට්ටුව ළඟට ඇවිල්ලා දුකෙන් බලාගෙන ඉන්නවා.නෙලී එහෙම බලාගෙන ඉන්න කොට මටත් දුක හිතෙනවා.





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිමර්ණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාථර් ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව කියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන කි්‍රයාමූලික පයේර්ෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා කි්‍රයාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත්අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනථර්කාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිමර්ාණය වීමට හේතු වී ඇති බව පයේර්ෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් කි්‍රයාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාටර් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිමර්ාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල්ෙවිදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිමර්ාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිමර්ාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්